# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අංක 1877/27 දරන 2014.08.28 දිනැති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ 11.2 වගන්තිය යටතේ
ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරේ පුරප්පාඩු පිරවීම

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ අධ්‍යක්ෂ තනතුරට පත් කිරීම සඳහා අංක 1877/27 දරන 2014 අගෝස්තු මස 28 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 1996/25 හා 2016 දෙසැම්බර් මස 06 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයෙන් සංශෝධනය කරන ලද, 2006.01.01 දින සිට බලපැවැත්වෙන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11.2 වගන්තිය ප්‍රකාරව, 2025.08.29 දිනට 02 ඡේදය යටතේ දක්වා ඇති නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ දැනට සක්‍රිය සේවයේ නියුතු I ශ්‍රේණියට උසස් වීම් ලැබූ නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

***සැලකිය යුතුයි.-*** තනතුරට පත් කරන අවස්ථාවේ දී ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියට උසස් වී තිබීම අනිවාර්යය වේ.

01. පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු අංකය* | *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු ගණන* |
|---|---|---|---|
| 01 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ | 01 |

02. උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්:

| *අනු අංකය* | *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *සුදුසුකම* |
|---|---|---|---|
| 01 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධරයෙකු වීම හෝ දෙපාර්තමේන්තුව තුළ අදාළ සුදුසුකම් සපුරා ඇති නිලධරයෙකු නොමැති අවස්ථාවල තනතුරට අදාළ මූලික සුදුසුකම්වන 7.2.2.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම්වන,<br><br>රසායන විද්‍යාව පිළිබඳ 1 පෙළ හෝ 2 පෙළ සාමාර්ථයන් සහිත විශේෂ උපාධියක් ලබා තිබීම;<br>*හෝ*<br>රසායන විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් සමඟ රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම;<br>*හෝ*<br>රසායන විද්‍යාව විෂයයක් ලෙස ඇති උපාධියක් සමඟ රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම. |

03. තනතුරු සඳහා තෝරා ගනු ලබන ක්‍රමය :

(i) ජ්‍යෙෂ්ඨතාව සහ කුසලතාව පදනම් කරගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් එම කොමිෂන් සභාව විසින් අනුමත පහත දැක්වෙන ලකුණු පරිපාටියට අනුකූලව ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

04. ලකුණු පරිපාටිය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **1.** ජ්‍යෙෂ්ඨතාව | | **50** |
| I.1. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ලබා දේ.<br>➢ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා සඳහා උපරිම ලකුණු ප්‍රමාණය ලබා දෙනු ලැබේ.<br>➢ අනෙකුත් නිලධරයන් සඳහා ජ්‍යෙෂ්ඨතාවය = (ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු / ජ්‍යෙෂ්ඨතම නිලධරයාගේ I ශ්‍රේණියේ අමතර සේවා කාලය (අවුරුදු x12+මාස)) x අදාළ නිලධරයාගේ I ශ්‍රේණියේ අමතර සේවා කාලය (අවුරුදු x12+මාස) | 50 | |
| **1.** කුසලතාව | | **50** |
| 2.1. ක්ෂේත්‍රයට අදාළව තේවල හෝ කණ්ඩායම් වශයෙන් සිදු කරන ලද;<br>I. පර්යේෂණාත්මක ප්‍රකාශන (Research Publications) – | | |
| ➢ දේශීයව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන (Local Research Publications ) – එක් පර්යේෂණාත්මක ප්‍රකාශනයක් සඳහා ලකුණු 02 බැගින් උපරිම ප්‍රකාශන 2ක් සඳහා | 04 | |
| ➢ ජාත්‍යන්තරව පළකරන ලද පර්යේෂණාත්මක ප්‍රකාශන (International Research Publications ) – එක් පර්යේෂණාත්මක ප්‍රකාශනයක් සඳහා ලකුණු 03 බැගින් උපරිම ප්‍රකාශන 2ක් සඳහා | 06 | |
| II. සාරාංශ (Abstracts) | | |
| ➢ ශ්‍රී ලංකාව තුළ (Local ) – එක් සාරාංශයක් සඳහා ලකුණු 02බැගින් උපරිම සාරාංශ 2ක් සඳහා) | 04 | |
| ➢ ජාත්‍යන්තර (International ) - එක් සාරාංශයක් සඳහා ලකුණු 2.5 බැගින් උපරිම සාරාංශ 2ක් සඳහා | 05 | |
| III. නිබන්ධන - එක් නිබන්ධනයක් සඳහා ලකුණු 04 බැගින් උපරිම නිබන්ධන 1ක් සඳහා (සැ.යු : දෙවන කාර්යක්ෂමතා කඩඉම හෝ I ශ්‍රේණියට උසස් වීමට සලකනු ලැබූ පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනය හැර වෙනත් නිබන්ධන සඳහා පමණක් ලකුණු ලබා දේ.) | 04 | |
| IV. නව්‍යතා / නවෝත්පාදනයන් - එක් නව්‍යතා / නවෝත්පාදනයක් සඳහා ලකුණු 04 බැගින් උපරිම නව්‍යතා / නවෝත්පාදනයන් 2ක් සඳහා | 08 | |
| *සටහන* -: අදාළ නිලධරයන්ගේ මූලිකත්වයෙන් සාර්ථකව ක්‍රියාත්මක වූ නවෝත්පාදනයන් බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තහවුරු කළයුතු අතර එය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඇගයීමට ලක්කර නව්‍යතාවක් හෝ නවෝත්පාදනයක් යන්න තහවුරු කර ගැනීමෙන් අනතුරුව ලකුණු ලබා දෙනු ලැබේ. | | |

| පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| V. පුවත්පත් / සඟරා ලිපි - එක් පුවත්පතක් / සඟරා ලිපියක් සඳහා ලකුණු 02 බැගින් උපරිම පුවත්පත් / සඟරා ලිපි 2ක් සඳහා | 04 | |
| VI. තෝරාපත් කරන තනතුරෙහි කාර්ය භාරය සඳහා දායකත්වය දක්වන ආකාරය සම්බන්ධයෙන් පරිගණකය ආශ්‍රයෙන් සිදු කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීම (Power Point Presentation)<br><br>I. අදාළත්වය (Relevancy) - ලකුණු 03<br>II. නිර්මාණශීලීත්වය / (Creativity ) - ලකුණු 03<br>III. ඒ සඳහා හඳුන්වාදෙන නව්‍යතා හා නව යෝජනා (Innovations & Suggestions) - ලකුණු 03<br>IV. කාල කළමනාකරණය (Time Management) - ලකුණු 03<br>V. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව (Proficiency in English) - ලකුණු 03<br><br>සටහන -<br><br>(අ) ඉහත (v) නිර්ණායකය යටතේ ලකුණු ලබා ගත හැක්කේ අයදුම්කරු ඉංග්‍රීසි භාෂාව මගින් මෙම ඉදිරිපත් කිරීම සිදු කරන්නේ නම් පමණි.<br>(ආ) ඉදිරිපත් කිරීමට අදාළ දෘඪ පිටපත (Hard Copy) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය. අමතර වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද ඉදිරිපත් කිරීමේ දෘඪ පිටපතක් ද මෙම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. | 15 | |
| **මුළු ලකුණු** | | **100** |

05. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1877/27 දරන 2014 අගෝස්තු මස 28 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද) එම ව්‍යවස්ථාවට සිදු කර ඇති හෝ මින් මතු සිදු කෙරෙන හෝ සංශෝධන වලට ද යටත්ව, තෝරා ගනු ලබන නිලධරයින් අදාළ තනතුරුවල රාජකාරි භාර ගන්නා දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ තනතුරුවලට පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

06. මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරාලන දැනට සක්‍රීය සේවයේ නිරත නිලධරයන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

07. පහත ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව, ලියාපදිංචි තැපෑලෙන් **2025.08.29** දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි "ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07" යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරෙහි "ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලබන අතර අයදුම්පත් අස්ථානගත වීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන් වන පැමිණිලි භාර ගනු නොලැබේ.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

09. අයදුම්පත්‍රය www.pubad.gov.lk ඔස්සේ ද බා ගත කළ හැකි ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර,
ලේකම්.
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 ජූලි මස 28 වැනි දින.